පරීක්ෂණ දිනය වේලාව වෙන් කිරීම්,වෙනස් කිරීම්, අවලංගු කිරීම සඳහා :

ගිණුමක් සකසන්න

ලොග් වන්න

- පරිශීලක නාමය (User name ) අමතකද
- මුරපදය (Password ) අමතකද

විභාග මධ්‍යස්ථානයක් සෙවීම විභාග සංදර්ශකය විභාග සලකා බැලීම් සම්බන්ධව විමසීම

Ｊ Ｂ Ｍ Ａ | ජාතික ගොඩනැගිලි නඩත්තු සංගම් ( Ｊ Ｂ Ｍ Ａ ) පරීක්ෂණය

## ගොඩනැගිලි පිරිසිදු කිරීමේ ක්ෂේත්‍ර විශේෂ කුසලතා අංක 1 ඇගයීම් පරීක්ෂණය

මෙය " විශේෂ කුසලතා අංක 1 (ගොඩනැගිලි පිරිසිදු කිරීම)" පදිංචි තත්ත්වය සහිතව ජපානයේ සේවය කිරීමට කැමති පුද්ගලයින් විසින් මුහුණ දෙනු ලබන කුසලතා පරීක්ෂණයකි. ගොඩනැගිලි පිරිසිදු කිරීම සම්බන්ධයෙන් ඔබේ කුසලතා සහ දැනුම අපි පරීක්ෂා කරන්නෙමු.

## පරීක්ෂණයට පෙනී සිටීම සඳහා තිබිය යුතු සුදුසුකම්

- පරීක්ෂණ දිනය වන විට අයදුම්කරුට වයස අවුරුදු 17 හෝ ඊට වැඩි විය යුතුය. එසේම, ඉන්දුනීසියානු ජාතික අයදුම්කරුවන්ට පරීක්ෂණ දිනය වන විට වයස අවුරුදු 18 හෝ ඊට වැඩි විය යුතුය.
- ජපානයේ රැඳී සිට පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ට වලංගු පදිංචිය පිළිබඳ සහතිකයක් තිබිය යුතුය.

## පරීක්ෂණ අන්තර්ගතය සහ පරීක්ෂණ කාලසීමාව

පරීක්ෂණය ලිඛිත සහ ප්‍රායෝගික යන පරීක්ෂණවලින් සමන්විත වේ. සියලුම පරීක්ෂණ ජපන් භාෂාවෙන් සිදු කෙරේ.

ලිඛිත පරීක්ෂණය: ප්‍රශ්න ගණන 20 (සමත් වීමට 60% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය), කාලය විනාඩි 20

ප්‍රායෝගික පරීක්ෂණය: ප්‍රශ්න ගණන 30 (සමත් වීමට 60% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය), කාලය විනාඩි 30

තවද, මිනිත්තු 50ක පරීක්ෂණයට අමතරව, හෙළිදරව් නොකිරීමේ ගිවිසුමකට එකඟ වීමට, නිබන්ධනයක් සම්පූර්ණ කිරීමට සහ සමීක්ෂණයක් සම්පූර්ණ කිරීමට විනාඩි 10 ක් ගත වේ.

## පරීක්ෂණ ගාස්තුව

ජපානයේ රැඳී සිටිමින් පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්: යෙන් 4400 (10% පරිභෝජන බද්ද ඇතුළුව)

ජපානයෙන් පිටත පරීක්ෂණය සඳහා පෙනී සිටින්නේ නම්: ඇමරිකානු ඩොලර් 30

## මාර්ගගත ලියාපදිංචිය, වෙන්කිරීම් සහ පරීක්ෂණ ක්‍රියා පටිපාටිය

### පියවර 1: නව පරිශීලක ලියාපදිංචිය (ගිණුම් ලියාපදිංචිය)

Pearson VUE සමඟ ගොඩනැගිලි පිරිසිදු කිරීමේ ක්ෂේත්‍ර විශේෂ කුසලතා අංක 1 තක්සේරු පරීක්ෂණය සඳහා පෙනී සිටීමට, ඔබ පරිශීලක ගිණුමක් සඳහා ලියාපදිංචි විය යුතුය. "ගිණුමක් සකසන්න" ක්ලික් කර පරිශීලකයෙකු ලෙස ලියාපදිංචි වීමට තිරයේ ඇති උපදෙස් අනුගමනය කරන්න. ඔබට දැනටමත් ගිණුමක් තිබේ

නම්, 2වන පියවර වෙත යන්න.
※ ඔබ ලියාපදිංචි වූ නම, පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී පරීක්ෂණ මධ්‍යස්ථානයේදී ඉදිරිපත් කරන තම හැඳුනුම්පතේ නමට වඩා වෙනස් නම්, ඔබට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර නොලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**සටහන**
2026 මාර්තු 31 වන දින දක්වා අයදුම් කල හැක. 2026 අප්‍රේල් 1 වන දිනට පසු පද්ධතියෙන් වෙන් කිරීම් කර ගත හැකි නමුත්, එසේ සිදු නොකරන්න.

### පියවර 2: පරීක්ෂණය වෙන්කරවා ගැනීම
පියවර 1හි ලියාපදිංචි කළ ඔබගේ පරිශීලක නාමය සහ මුරපදය ඇතුළත් කර පරීක්ෂණයක් වෙන් කරවා ගන්න.
※ ඔබට වවුචරයක් තිබේ නම්, ඔබ ඔබේ ගෙවීම් සහ බිල්පත් තොරතුරු ඇතුළත් කරන තිරයේ "වවුචරය හෝ ප්‍රවර්ධන කේතය එක් කරන්න" යන්න ක්ලික් කර, ඔබේ වවුචර් අංකය ඇතුළත් කර, "අයදුම් කරන්න" යන්න ක්ලික් කරන්න. ඉන්පසු ඔබේ වෙන්කිරීම සම්පූර්ණ කරන්න.
※ ඔබගේ වෙන්කිරීම සම්පූර්ණ වූ පසු, ඔබට තහවුරු කිරීමේ විද්‍යුත් තැපැල් පණිවිඩයක් ලැබෙනු ඇත.

### වෙන් කිරීමේ අවසාන දිනය, වෙන්කිරීම් වෙනස් කිරීම සහ අවලංගු කිරීමේ අවසාන දිනය
- **වෙන් කිරීමේ අවසාන දිනය:** අයදුම් කිරීමට බලාපොරොත්තු වන පරීක්ෂණ දිනයට පෙර දින රාත්‍රී 11:59
- **වෙනස් කිරීමේ සහ අවලංගු කිරීමේ අවසාන දිනය:** වර්තමාන වෙන්කිරීමේ දිනය සහ වේලාව අවසන් වීමට පැය 24කට පෙර

**සැ.යු** : සියලුම කාලසීමාවන් මාර්ගගත වෙන්කිරීමේ වෙබ් අඩවියේ කාලසීමාවන් වේ. පාරිභෝගික සේවාව හරහා වෙන් කිරීමක් සිදු කරන විට, වෙනස් කරන විට හෝ අවලංගු කරන විට, ඔබ අදාළ කාලසීමාවන් තුළ සහ පාරිභෝගික සේවා විවෘතව පවතින වේලාවන් තුළ ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුතුය. වෙන්කිරීම් අවසන් දිනට පසුව වෙන් කිරීම් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට නොහැකිය.

### ගෙවීම් සිදු කරන ආකාරය
පරීක්ෂණ සඳහා වන ගාස්තු ගෙවිය හැක්කේ ක්‍රෙඩිට් කාඩ් හෝ වවුචර් මගින් පමණි.

- ක්‍රෙඩිට් කාඩ්
  VISA、Master、JCB、AMEX ආදී කාඩ්පත් භාවිතා කළ හැකිය.
- පෙරගෙවුම් වවුචර්
  ඔබගේ සමාගම හෝ පාසල විසින් පරීක්ෂණ ගාස්තු ගෙවන්නේ නම්, පෙරගෙවුම් වවුචරයක් භාවිතා කළ හැකිය. කෙසේ වෙතත්, අවම මිලදී ගැනීමේ ප්‍රමාණය පරීක්ෂණ 10කි (පුද්ගලයින් 10). පෙරගෙවුම් වවුචරයක් මිලදී ගන්නා ආකාරය පිළිබඳ විස්තර සඳහා, කරුණාකර පහත සබැඳිය බලන්න. පෙරගෙවුම් වවුචර් මිලදී ගැනීමෙන් පසු, එක් එක් අපේක්ෂකයාට වවුචර් අංක බෙදා දෙන්න.
  (ජපානයේදී පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්) වවුචර් අලෙවිසැල ※අවම මිලදී ගැනීමේ ප්‍රමාණය: පරීක්ෂණ 10 සිට
  (ජපානයෙන් පිටත පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්) Purchase Vouchers ※අවම මිලදී ගැනීමේ ප්‍රමාණය: පරීක්ෂණ 1 සිට

### පියවර 3: පරීක්ෂණයට සූදානම් වීම
පරීක්ෂණ දිනය සඳහා සූදානම් වීමේ කටයුතු සහ ක්‍රියා පටිපාටි සඳහා කරුණාකර පහත පිටුව පරීක්ෂා කරන්න.

- පරීක්ෂණයට පෙර පරීක්ෂා කර තබාගත යුතු දේවල්
  පරීක්ෂණයට පෙර පරීක්ෂා කර තබාගත යුතු දේවල් ( ජපන් භාෂාව )
  Helpful resources for test-takers ( English )
- පරීක්ෂණ දිනයේදී පරීක්ෂණ මධ්‍යස්ථානයේ සාමාන්‍ය ක්‍රියාවලිය (වීඩියෝ පටය )
  පරීක්ෂණ ක්‍රියා පටිපාටිය ( ජපන් භාෂාව )
  What to expect when testing with Pearson VUE ( English )
- CBT ආදර්ශ පරීක්ෂණය
  ආදර්ශ පරීක්ෂණය ( ජපන් භාෂාව )

**පියවර 4: පරීක්ෂණයට පෙනී සිටීම**

**පරීක්ෂණය සඳහා පැමිණිය යුතු වේලාව**

ඔබගේ පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා කරුණාකර ඔබගේ පරීක්ෂණය ආරම්භ වීමට අවම වශයෙන් මිනිත්තු 15කට පෙර පරීක්ෂණ මධ්‍යස්ථානයට පැමිණෙන්න. ඔබ ප්‍රමාද වුවහොත්, ඔබට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර නොලැබෙන අතර ඔබේ පරීක්ෂණ ගාස්තුව ද ආපසු ගෙවනු නොලැබේ.

**පරීක්ෂණයට පැමිණෙන විට රැගෙන ආ යුතු දේවල්**

විභාග ශාලාවට ඇතුලත් වීමේදී, **වලංගු හැඳුනුම්පතක්** ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා කරුණාකර පහත පිටුව බලන්න. "පරීක්ෂණ වෙන්කිරීමේදී භාවිතා කළ නම" සහ "ඔබේ හැඳුනුම්පතේ නම" වෙනස් නම්, ඔබට **පරීක්ෂණ**යට පෙනී සිටීමට අවසර නොලැබේ. ඔබගේ නම නොගැලපීම හේතුවෙන් ඔබට **පරීක්ෂණ**යට පෙනී සිටීමට අවසර නොලැබුණු විට, ඔබේ **පරීක්ෂණ** ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

(ජපානයේදී පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්) අනන්‍යතාව තහවුරු කිරීමේ ලේඛන පිළිබඳව ※ඔබ ජපානයේදී පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්, කරුණාකර ඔබගේ විදේශ ගමන් බලපත්‍රය රැගෙන එන්න.

(ජපානයෙන් පිටත පරීක්ෂණයට පෙනී සිටින්නේ නම්) Global ID Policy 1 ※ඔබට විදේශ ගමන් බලපත්‍රයක් තිබේ නම්, කරුණාකර එය රැගෙන එන්න.

විභාග ශාලාව තුළට කිසිදු පෞද්ගලික අයිතමයක් රැගෙන යාමට අවසර නැත. පරීක්ෂණයට අනවශ්‍ය කිසිවක් රැගෙන නොයන්න.
පිළිගැනීමේ දොරටුව ඉදිරිපසදී ලැමිනේට්න් සුදු පහැති සටහන් පොත් සහ පෑන් (ඉක්මනින් වියළන ජලය මත පදනම් වූ පෑන්) ලබා දෙනු ඇත, එබැවින් ඔබට පරීක්ෂණය අතරතුර සටහන් ගැනීමට හැකි වනු ඇත. පරීක්ෂණයෙන් පසු, සුදු සටහන් පොත් සහ පෑන් නැවත එකතු කරනු ලැබේ.




**හෙළිදරව් නොකිරීමේ ගිවිසුමට (NDA) එකඟවීම**

පරීක්ෂණ මධ්‍යස්ථානයකදී පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර, ඔබ හෙළිදරව් නොකිරීමේ ගිවිසුමකට (NDA) එකඟ විය යුතුය. NDA යනු ප්‍රධාන වශයෙන් තෙවන පාර්ශවයන්ට ප්‍රශ්න හෝ පිළිතුරු හෙළි නොකිරීමේ ගිවිසුමකි. ඔබ ගිවිසුමට එකඟ නොවන්නේ නම්, ඔබට පරීක්ෂණය ආරම්භ කිරීමට නොහැකි වනු ඇත. තවද, ඔබ ගිවිසුමට එකඟ නොවී  පරීක්ෂණයට පෙනී නොසිටීමට තීරණය කළ අවස්ථාවක වුවද ඔබේ පරීක්ෂණ ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු, ඔබ ගිවිසුමේ නියමයන් උල්ලංඝනය කරන කිසියම් තහනම් හැසිරීමක නිරත වී ඇති බව අනාවරණය වුවහොත්, සහතික කිරීමේ ආයතනය ඔබේ සහතිකය අවලංගු කිරීමට හෝ අනාගතයේදී ඔබට විභාග තහනමක් පැනවීමට ඉඩ තිබේ.

**පියවර 5: පරීක්ෂණ ප්‍රතිඵල**

පරීක්ෂණ ප්‍රතිඵල ඔබට පහත සඳහන් ආකාර 2 මඟින් දැනුම් දෙනු ලැබේ:

- ලකුණු වාර්තාව
  පරීක්ෂණය අවසන් කළ වහාම, ඔබට විභාග  මධ්‍යස්ථානයේදී මුද්‍රිත ලකුණු වාර්තාවක් (සමත්/අසමත්) ලබා දෙනු ඇත.
  ඔබට පසු දිනකදී ඔබේ පියර්සන් (Pearson) VUE පරිශීලක පිටුවෙන් එම ලකුණු වාර්තාව බලාගත හැකිය.
  **සැ:යු** :  ලකුණු වාර්තාවක් යනු සමත් වූ බවට වන සහතික පත්‍රයක් නොවේ.
- සමත් වීමේ සහතික පත්‍රය
  පරීක්ෂණයෙන් සමත් වූ අපේක්ෂකයා සහ සත්කාරක සංවිධානය අතර රැකියා ගිවිසුමක් ඇති වන බවට තීරණය කිරීමෙන් පසු, අපේක්ෂකයා විසින් සහතික පත්‍රයක් අයදුම් කර යෙන් 11000ක නිකුත් කිරීමේ ගාස්තුව (10% පරිභෝජන බද්ද ඇතුළුව) ගෙවීමෙන් පසු, ජපන් ගොඩනැගිලි නඩත්තු සංගමය විසින් සත්කාරක සංවිධානයට සමත් වීමේ සහතික පත්‍රයක් නිකුත් කරනු ඇත.

## සැලකිලිමත් විය යුතු කරුණු

වංචනික ක්‍රම මගින් පරීක්ෂණයට පෙනී සිටීමට උත්සාහ කරන හෝ පෙනී සිටි ඕනෑම අයෙකුට වසර පහක් දක්වා පරීකෂණයට පෙනී සිටීම තහනම් කෙරේ.
තවද, ඔබ වංචනික ක්‍රියාවන් හෝ ක්‍රම මගින් පරීක්ෂණය සමත් වුවහොත්, ඔබගේ සමත් වීමේ සහතිකය අවලංගු කරනු ලබන අතර, අපි ඔබගේ සමත් වීමේ සහතිකය ආපසු ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන්නෙමු.
විභාග ගාස්තු සහ සහතික නිකුත් කිරීමේ ගාස්තු ආපසු ලබා නොදෙන බව කරුණාවෙන් සලකන්න.

## පෞද්ගලික තොරතුරු

පරීක්ෂණය සඳහා අයදුම් කිරීමේදී හෝ පරීක්ෂණ මධ්‍යස්ථානයේදී ඔබ සපයන පෞද්ගලික තොරතුරු ජාතික ගොඩනැගිලි නඩත්තු සංගමයේ පෞද්ගලික තොරතුරු ආරක්ෂණ රෙගුලාසිවලට අනුකූලව, පරීක්ෂණය පැවැත්වීම, සමත් වීමේ සහතික නිකුත් කිරීම සහ විශේෂ  කුසලතා පද්ධතිය සලකා බැලීම සඳහා භාවිතා කරනු ලැබේ. තවද, ජපානයේ හෝ විභාග අපේක්ෂකයාගේ මව් රටෙහි රාජ්‍ය ආයතනවලට ඔබගේ පෞද්ගලික තොරතුරු ලබා දෙන අවස්ථාද පවතී.

## - අදාළ සබැඳි

ජපන් ගොඩනැගිලි නඩත්තු සංගමය

පරීක්ෂණයක් වෙන් කිරීම පිළිබඳ  නිතර අසන ප්‍රශ්න

පරීක්ෂණ දිනයේ පරීක්ෂණ මධ්‍යස්ථානයේදී සිදුවන ක්‍රියා පටිපාටි

## - විමසීම්

ඔබගේ විමසීමේ අන්තර්ගතය අනුව විමසීම් මධ්‍යස්ථාන වෙනස් වන බව කරුණාවෙන් සලකන්න.

| **විමසීම් අන්තර්ගතය** | **විමසීම් මධ්‍යස්ථාන** |
|---|---|
| • ගිණුම් ලියාපදිංචිය, පරීක්ෂණ වෙන් කරවා ගැනීමේ ක්‍රමය සහ වෙන්කිරීම් සම්පූර්ණ කිරීමේ දැනුම්දීමේ විද්‍යුත් තැපැල සම්බන්ධයෙන්<br>• අනන්‍යතා තහවුරු කිරීමේ ලේඛන සම්බන්ධයෙන්<br>• ගිණුමක් ලියාපදිංචි කිරීමෙන් පසු නම වෙනස් කිරීම සම්බන්ධව<br>• පරීක්ෂණ මධ්‍යස්ථාන ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් | **පියර්සන් (Pearson) VUE පාරිභෝගික සේවය**<br>https://www.pearsonvue.com/us/en/test-takers/customer-service/email.html |
| • පරීක්ෂණ අන්තර්ගතය සම්බන්ධව<br>• පරීක්ෂණය සඳහා වන සුදුසුකම් සහ කොන්දේසි සම්බන්ධව<br>• පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධව<br>• සහතික පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් | **ජපන් ගොඩනැගිලි නඩත්තු සංගමය**<br>**විද්‍යුත් තැපැල :** tokuteiginou@j-bma.or.jp |